සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மத்திய மாகாண கல்வித் திணைக்களம்**
**Department of Education Central Province**

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 81 | S | I |
|---|---|---|---|---|

**කෘෂි හා ආහාර තාක්ෂණය I** — කාලය පැය 01 යි

**උපදෙස්-:**
* I පත්‍රය සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා සපයා ඇති පිළිතුරු පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (×) ලකුණ යොදන්න.
* මෙම පත්‍රයට හිමි ලකුණු ගණන 40 කි.

01. මිනිසා සතුන් හීලෑ කරගෙන ප්‍රයෝජන ලබා ගනිමින් ගෙවූ යුගය හඳුන්වන්නේ,
1. දඩයම් යුගය නමිනි. 2. එඬේර යුගය නමිනි. 3. ගොවි යුගය නමිනි. 4. සත්ව පාලන යුගය නමිනි.

02. අඹන් ගඟ හරස්කර අමුණක් ඉදිකර මින්නේරි හා කන්තලේ වැවට ජලය ලබාදීමට අතීතයේ සකස් කළ ඇළ මාර්ගය වන්නේ,
1. යෝධ ඇලය. 2. මිනිපේ ඇලය. 3. ජය ගඟය. 4. ඇළහැර ඇළය.

03. 'මඩ' සෝදාගත් කළ හෙළ ගොවියා රජකමට පවා සුදුසුයි, යන ප්‍රකාශය කරන ලද්දේ
1. ඩී.එස්. සේනානායක මහතා
2. ජේ.ආර්. ජයවර්ධන මහතා
3. රොබට් නොක්ස් මහතා
4. ආතර් සී ක්ලාක් මහතා

04. හරිත විප්ලවය 1960 දශකයේ අග භාගයේ දී ශ්‍රී ලංකාවේ ආරම්භ විය. එහිදී කෘෂි කර්මාන්තයට එක් නොවූ අංගයක් වන්නේ,
1. කෘෂි රසායනික ද්‍රව්‍ය 2. කෘෂි යන්ත්‍රෝපකරණ 3. කෘතිම පොහොර 4. දේශීය බීජ වර්ග භාවිතය

05. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප වලට බෙදීමේ දී ප්‍රධාන වශයෙන් පදනම් කරගෙන ඇත්තේ
1. උෂ්ණත්වය 2. වර්ෂාපතනය 3. ආර්ද්‍රතාවය 4. උච්චත්වය

06. යල කන්නයේදී ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබෙන ක්‍රමය වන්නේ
1. සංවහන වර්ෂාව
2. නිරිත දිග මෝසම් වර්ෂාව
3. ඊසාන දිග මෝසම් වර්ෂාව
4. වාසුලි වර්ෂාව

07. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක උෂ්ණත්වමාන සවිකිරීමට යොදා ගන්නා ස්ටීවන්සන් ආවරණයේ සුදු පාට ආලේප කර ඇති නිසා,
1. අනවශ්‍ය ලෙස කාලගුණික බලපෑම් වලට උපකරණ හසුවීම වැළකේ.
2. උෂ්ණත්වය බාහිර පරිසරයට සමාන වේ.
3. විකිරණයෙන් වන බලපෑම අවම වේ.
4. උපකරණවලට ආරක්ෂාව සැපයේ.

08. පසේ වයනය නිරීක්ෂණය කිරීමේදී පස් සාම්පලය තෙත් කර දෙඅත්ල මත තබා රෝල් කර නොකැඩෙන මුදුවක් සකස් කළ හැකි නම්,
1. වැලි පසක් විය යුතුය.
2. වැලි ලෝම පසක් විය යුතුය.
3. ලෝම පසක් විය යුතුය.
4. මැටි පසක් විය යුතුය.

09. වගා මාධ්‍යය පුරවා ඇති බඳුනක ජලය සැපයීමෙන් පසු පතුලෙහි සිදුරෙන් අතිරික්ත ජලය කාන්දු වීම අවසාන වූ පසු එම වගා මාධ්‍යය තුළ තිබේ යැයි අපේක්ෂා කළ හැක්කේ,
1.ගුරුත්වාකර්ෂණ ජලය හා කේෂාකර්ෂණ ජලයයි.
2. ගුරුත්වාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලයයි.
3. කේෂාකර්ෂණ ජලය හා ජලාකර්ණෂණ ජලයයි.
4. ගුරුත්වාකර්ෂණ ජලය හා කේෂාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලය.

10. බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු පාංශු සංඝටක ප්‍රතිශත රූප සටහනේ දැක්වේ. ඒ අනුව A,B,C,D අනුපිළිවෙලින් විය යුත්තේ,




1. ජලය, වාතය, කාබනික ද්‍රව්‍ය, ඛනිජ
2. වාතය, ජලය, ඛනිජ, කාබනික ද්‍රව්‍ය
3. කාබනික ද්‍රව්‍ය, වාතය, ඛනිජ, ජලය
4. ජලය, ඛනිජ, කාබනික ද්‍රව්‍ය, වාතය

11. අධික වියලි දේශගුණයක් පවතින ප්‍රදේශවල පසේ ලවණතාවය වැඩිවීමට ප්‍රධාන හේතුව වන්නේ,
1. පසට වැඩි වාර ගණනක් ජලය සැපයීම.
2. පාංශු ජලය අධික ලෙස වාෂ්පීකරණය වීම.
3. කාබනික පොහොර වැඩි වශයෙන් යෙදීම.
4. පසේ මැටි අංශු අධිකව පැවතීම.

12. විපරීත පාෂාණයට උදාහරණයක් වන නයිස් පාෂාණය බහුලව දැකිය හැකි ප්‍රදේශයක් වන්නේ,
1. කඩුගන්නාව 2.මාතලේ 3. වැලිමඩ 4. දඹුල්ල

13. වැහි බිඳු පස මත එක එල්ලේ පතිත වීම නිසා පස් අංශු පාංශු දේහයෙන් වෙන්වීම හඳුන්වන්නේ,
1. පාංශු ඛාදනය නමිනි.
2. විසිරි ඛාදනය නමිනි.
3. රළි ඛාදනය නමිනි.
4. දිය පහර ඛාදනය නමිනි.

14. මාතලේ, මහනුවර, නුවරඑළිය යන දිස්ත්‍රික් තුනෙහිම පැතිරී ඇති පස් කාණ්ඩය වන්නේ,
1. රතු දුඹුරු පස
2. දියලු පස
3. රතු කහ පොඩ්සොලික් පස
4. රතු දුඹුරු ලැටරයිට් පස

15. මාෂ බෝග අයත් බෝග කාණ්ඩය වන්නේ,
1. මුං, කව්පි, උඳු, රට කජු
2. කුරක්කන්, තල, වී, බඩ ඉරිඟු
3. බතල, ඉන්නල, වැල් අල
4. සෝයා බෝංචි, බඩ ඉරිඟු, තල

16. බැවුම් ඉඩම්වල සෝදා පාළුව වැළැක්වීම සඳහා ආවරණ බෝග ලෙස වගා කළ හැකි බෝග කාණ්ඩය වන්නේ,
1. ගිණි A, ගිණි B
2. පියුරේරියා, ඩෙස්ටෝඩියම්
3. ඉපිල් ඉපිල්, ග්ලිරිසීඩියා
4. සන්හෙම්ප්, පොතු තණ

17. කරවිල, පතෝල, වැටකොළු, වට්ටක්කා වැනි බෝග අයත් ශාක කුලය වන්නේ,
1. සොලනේසියේ 2. මැල්වේසියේ 3. පොඒසියේ 4. කුකර්බිටේසියේ

18. තෙතමනය ප්‍රියකරන කංකුං, මුකුණුවැන්න, කොහිල, ගොටු කොළ වැනි බෝග වගා කිරීම සඳහා සුදුසු පාත්ති වර්ගයකි.
1. වැටිහා කානු 2. ගිල්වූ පාත්ති 3. උස්පාත්ති 4.වගා වළවල්

19. බිම් සකස් කිරීමේ උපකරණ පිළිබඳව ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A. ගල් මුල් සහිත ඉඩමක පස පෙරළීම සඳහා තැටි නගුල වඩාත් සුදුසු වේ.
B. ගැමි ලී නගුල හා තල පෝරුව සත්ව බලයෙන් ක්‍රියාකරවන උපකරණ වේ.
C. කොකු නගුල (දැති පෝරුව) ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.

මේවායින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
1. A හා B 1. A හා C 1. B හා C 1. A,B හා C යන සියල්ලම

20. ජපන් රොටරි වීඩරය භාවිතයේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. පසට පොහොර යෙදීම
2. පස සමතලා කිරීම.
3. පේළියට වගා කර ඇති වගා භූමියක වල් මර්දනය
4. ගොයම් කැපීම සඳහා

21. තවාන් පාත්ති සැකසීමේදී වසුන් ලෙස යෙදීමට සුදුසු ද්‍රව්‍යයක් නොවන්නේ,
1. අලුත් පිදුරු 2. පිරිසිදු ගෝනි 3. කළු පොලිතීන් 4. වියලි මානා

22. අධෝභෞම ප්‍රරෝහණයක් පෙන්වන බීජ අයත් කාණ්ඩය
1. වී, කුරක්කන්, මිරිස්
2. රාබු, තක්කාලි, බඩ ඉරිඟු
3. කඩල, මිරිස්, වම්බටු
4. බඩඉරිඟු, කඩල, වී

23. තවත් පාත්ති ජීවානුහරණයේදී බහුලව යොදා ගන්නා දිලීර නාශකයකි.
1. ඇල්බට් ද්‍රාවණය 2. කැප්ටාන් 3. කියුලීන් 4. රූටෝන්

24. භූතල (පෘෂ්ඨීය) ජල සම්පාදන ක්‍රමයකි.
1. මල්බාදියෙන් ජලය යෙදීම
2. තීරු ජල සම්පාදනය
3. මැටි කළ වැළලීම
4. පොම්ප මගින් ජලය විසුරුවා හැරීම.

25. අඩු ජල ප්‍රමාණයක් ඇති විට යොදා ගැනීමට වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ,
1. බිංදු ජල සම්පාදනයයි. 2. බේසම් ජල සම්පාදනයයි.
3. ඇලි ජල සම්පාදනයයි. 4. ඉසින ජල සම්පාදනයයි.

26. කොම්පෝස්ට් පොහොර සකස් කිරීමේදී පරණ කොම්පෝස්ට් එයට එකතු කිරීමට හේතුව
1. පොහොර කළුපාට වර්ණය ඇති කිරීමට 2. පොහොර ප්‍රමාණය වැඩිකිරීමට
3. දිරාපත් වීම ඉක්මන් කරවීමට 4. පෝෂක ගුණය වැඩි කිරීමට.

27. ශාක පෝෂණය සඳහා පසෙන් ජලයෙන් හා වායුගෝලයෙන් ලබාගන්නා බැවින් ඌනතාවයන් නොපෙන්වන පෝෂක කාණ්ඩය වන්නේ,
1. කාබන්, හයිඩ්‍රජන් සහ ඔක්සිජන් 2. පොස්පරස්, පොටෑසියම් හා නයිට්‍රජන්
3. කැල්සියම්, මැග්නීසියම් හා පොටෑසියම් 4. සින්ක්, පොස්පරස් සහ කාබන්

28. කොම්පෝස්ට් නිපදවීමේ දී බිත්තර දමන කිකිළියන්ගේ ආස්තරණය එකතු කිරීමෙන් වැඩි කරගත හැකි මූල ද්‍රව්‍ය වන්නේ,
1. නයිට්‍රජන් 2. පොස්පරස් 3. පොටෑසියම් 4. කැල්සියම්

29. 'පන්' වර්ගයට අයත් වල් පැලෑටියකි
1. ඉලුක් 2. ඇටවරා 3. බැලතණ 4. තුනැස්ස

30. මී මැසි ගෝචර ශාකයක් ලෙස ලංකාවට ගෙන්වන ලද නමුත් දැනට ආක්‍රමණශීලී ශාකයක් ලෙස හඳුන්වන ශාකයකි.
1. ගඳපාන 2. මහ නිදිකුම්බා 3. විඩේලියා 4. පාතීනියම්

31. සොලනේසි කුලයේ බෝගවලට බහුලව වැළදෙන 'හිටු මැරීම' රෝගයේ රෝග කාරකයා
1. දිලීරයකි. 2. බැක්ටීරියාවකි 3. වෛරසයකි 4. වට පනුවෙකි

32. පටක විද යුෂ උරා බීමෙන් හානි කරන කෘමීන් වන්නේ,
1. කුඩිත්තා 2. ඉල්මැස්සා 3. එපිලැක්නා 4. පුරුක් පණුවා

33. ඉල්මැස්සාගේ හානියට බහුලව ලක්වන ශාක කුලය වන්නේ,
1. සොලනේසි කුලය 2. මල්වාසේ කුලය 3. කුකබිටේසි කුලය 4. පැබේසියේ කුලය

34. පසුගිය දිනවල මහත් ආන්දෝලනයකට ලක් වූ ලංකාවට ගෙන්වීම තහනම් කරන ලද පළිබෝධ නාශකයක් වන ග්ලයිපොසෙට්
1. දිලීර නාශකයකි 2. වල් නාශකයකි 3. කෘමි නාශකයකි 4. රසායනික පොහොරකි.

35. අර්ධ රූපාන්තරණය සහිත කෘමි පලිබෝධකයෙකි.
1.අවුලක පෝරා 2. ඉල්මැස්සා 3. එපිලැක්නා 4. ගොයම් මැස්සා

36. සහල් ග්‍රෑම් 100 ක අඩංගු කාබෝහයිඩ්‍රේට් ප්‍රමාණය දළ වශයෙන්
1. 100% 2. 50% 3. 75% 4. 25%

37. B.W. 351 නැමති වී ප්‍රභේදයේ අස්වනු නෙලීමට ගතවන කාලය
1. මාස 2 1/2 2. මාස 3 3. මාස 3 1/2 4. මාස 4

38. ශ්‍රී ලංකාවේ අඩුවෙන්ම වි වගා කෙරෙන දිස්ත්‍රික්කය වන්නේ,
1. කුරුණෑගල 2. යාපනය 3. හම්බන්තොට 4. නුවරඑළිය

39. අවම බිත්තර වී ප්‍රමාණයක් භාවිතා කළ වී වගා කළ හැකි තවාන් ක්‍රමය වන්නේ,
1. ඩැපොග් තවාන 2. තැටි තවාන 3. මඩ තවාන 4. ගොඩ තවාන

40. මඩ තවාන් සැකසීමේ දී වී තවාන් දැමීමට පෙර තවානට දහයියා අගුරු දැමීමෙන් සැලසෙන වාසිය වන්නේ,
1. පැළ ගලවා ගැනීම පහසුවීම. 2. හොඳින් ජලය බැස යාම
3. පැළ වලට පොහොර ලැබීම 4. තවාන ජීවානුහරණය වීම.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 81 S II |
|---|---|---|

**කෘෂි හා ආහාර තාක්ෂණය II** — කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* පළමුවන ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) වර්තමාන ශ්‍රී ලංකාවේ ජනතාවට මුහුණ දීමට සිදුව ඇති ගැටළු අතරින් බෝ නොවන රෝගයන්ට මුහුණ දීමට සිදුවන ප්‍රමාණය දිනෙන් දින වැඩි වීමක් දක්නට ලැබේ. දැනට දිස්ත්‍රික්ක 12 ක් පුරාම වකුගඩු රෝගීන් ද විශාල වශයෙන් දක්නට ලැබේ. මෙම ගැටළුවට කෘෂි රසායනික ද්‍රව්‍යද හේතු වන බැවින් එය නිරාකරණය කිරීම සඳහා කෘෂි කර්මාන්ත අංශයෙන්ද සැලකිය යුතු කාර්යයක් ඉටු කළ යුතුව ඇත.

1. ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි බෝ නොවන රෝග දෙකක් ලියන්න.
2. රසායනික පලිබෝධනාශක වෙනුවට භාවිතා කළ හැකිපරිසර හිතකාමී පලිබෝධනාශක දෙකක් නම් කරන්න.
3. පාංශු ඛාදනය වැළැක්වීම සඳහා වගා කළ හැකි ආවරණ බෝග දෙකක් නම් කරන්න.
4. බෝග වගාවේදී භාවිතා කළ හැකි කාබනික පොහොර වර්ග දෙකක් ලියන්න.
5. පසේ සාරවත් බව දියුණු කිරීම සඳහා යොදා ගත හැකි ශෂ්‍ය විද්‍යාත්මක පාංශු සංරක්ෂණ ක්‍රම දෙකක් ලියන්න.
6. පසට නයිට්‍රජන් ලබාදෙමින් පෝෂණ ගුණය ඉහළ නැංවීමට වගා කළ හැකි ෆැබේසියේ (Fabaceae) කුලයේ බෝග දෙකක් ලියන්න.
7. දියවැඩියා රෝගය පාලනයට සුදුසු දේශීය වී වර්ග දෙකක් ලියන්න.
8. මානසික සුවය, ව්‍යායාම හා පවුලේ එකමුතුව වැනි ගුණාංග වර්ධනය කර ගැනීමට හැකි , අඩු ඉඩකඩ සහිත නිවාසවාසීන්ට භාවිතා කළ හැකි වගා ක්‍රම දෙකක් ලියන්න.
9. වකුගඩු රෝගයට හේතු වේ යැයි සලකා මෑත කාලයේ තහනමට ලක් කරන ලද කෘෂි රසායනිකය නම් කරන්න.
10. කාලීන ගැටළුවක් වන වකුගඩු රෝගයට හේතුවන කෘෂිකාර්මික හේතු දෙකක් ලියන්න.

(02) ආලෝකය බෝග වගාව සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර, ඒ මගින් බෝග වර්ධනයට විවිධාකාර බලපෑම් ඇති කරයි. ඒඅතර, ආලෝක තීව්‍රතාවය, ගුණාත්මය හා ආලෝකය පවතින කාලසීමාව ඇති කරන බලපෑම් විශේෂ වේ.

1. වැඩි ආලෝක තීව්‍රතාවයක් ප්‍රියකරන බෝග වර්ග හතරක් ලියන්න.
2. ආලෝකයේ ගුණාත්මය අනුව නිල් සහ රතු ආලෝකය හා රතු ආලෝකය ශාකවල කුමන කාර්යයන්ට හිතකර වේද?
3. i. ආලෝකය පවතින කාලසීමාව ශාකවල ප්‍රධාන වශයෙන් බලපාන්නේ කුමන කාර්යයන් සඳහාද?
   ii. ඒ අනුව ශාක බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ මොනවාද?

(03) බෝග වගාවේදී ඉතා හොඳින් පශ්චාත් සාත්තු කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබාගත හැකි අතර, ජල සම්පාදනය ඒ අතර ඉතා වැදගත් තැනක් ගනී.

1. ශාකවලට ජලයෙන් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.
2. පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් පැහැදිලි කරන්න.
3. ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න.

(04)



1. ඉහත සඳහන් ජීවන චක්‍රය ගත කරන කෘමි පලිබෝධකයන් තිදෙනෙකු නම් කරන්න.
2. ඉන් එක් කෘමියෙකු හානි කරන බෝග වර්ග හානියේ ස්වභාවය හා පාලන ක්‍රම ලියන්න.
3. අර්ධ රූපාන්තරණයේ අවස්ථා පිළිවෙලින් ලියන්න.

(05) බෝග වගාවේදී බීජ හොඳින් ප්‍රරෝහණය වීමට මෙන්ම පැළයක් හොඳින් වර්ධනය වීමට සුදුසු ලෙස පස සකස් කිරීම ඉතා වැදගත්ය. මෙය බිම් සැකසීම ලෙස හඳුන්වන අතර, මේ සඳහා විවිධ උපකරණ භාවිතා කරනු ලැබේ.

1. බිම් සැකසීමේ අරමුණු හතරක් ලියන්න.
2. A- අතුරුයත් ගෑම යන්න හඳුන්වන්න.
   B - අතුරුයත් ගෑම සඳහා භාවිතා කළ හැකි උපකරණ දෙකක් නම් කරන්න
3. යොදනු ලබන බලය අනුව බිම් සැකසීමේ උපකරණ වර්ග කර උදාහරණ එක බැගින් ලියන්න.

(06)




රූප සටහනේ දැක්වෙන්නේ තවාන් පාත්තියක හරස් කඩකි.
1. මෙම පාත්ති වර්ගය නම් කරන්න.
2. "A" අක්ෂරයෙන් දැක්වෙන පාත්තියේ පළල කොපමණද?
3. "B" අක්ෂරයෙන් දැක්වෙන කොටසේ අඩංගු විය යුතු ද්‍රව්‍ය මොනවාද?
4. තවාන් බඳුන් ලෙස භාවිතා කළ හැකි පරිසර හිතකාමී බඳුන් වර්ග හතරක් ලියන්න.

(07) ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වන බත සැපයීම සඳහා අවශ්‍ය වී නිෂ්පාදනයට බහුලව වගා කරනු ලබන්නේ වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදයන්ය.
1. වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදවල විශේෂ ලක්ෂණ හතරක් ලියන්න.
2. ගොයම් පැළෑටියේ වර්ධන අවධි නම් කර කෙටියෙන් හඳුන්වන්න.
3. ශ්‍රී ලංකාවේ වී අභිජනන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන තුනක් හා ඒවායින් නිපදවන වී වර්ග හඳුන්වන කෙටි නම ලියන්න.

**වර්ෂ අවසාන පරීක්ෂණය - 2018**
**කෘෂි හා ආහාර තාක්ෂණය - 10 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 3 | 31. | 2 |
| 02. | 4 | 12. | 1 | 22. | 4 | 32. | 1 |
| 03. | 3 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 4 | 14. | 3 | 24. | 2 | 34. | 2 |
| 05. | 2 | 15. | 1 | 25. | 1 | 35. | 4 |
| 06. | 2 | 16. | 2 | 26. | 3 | 36. | 3 |
| 07. | 3 | 17. | 4 | 27. | 1 | 37. | 3 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 4 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 2 |
| 10. | 4 | 20. | 3 | 30. | 3 | 40. | 1 |

## II කොටස

(01) 1. දියවැඩියාව, හෘදයාබාධ, අධික රුධිර පීඩනය, වකුගඩු රෝග, කොලෙස්ටරෝල් අධික වීම, ගැස්ට්‍රයිටිස්, පිලිකා

2. කොහොඹ ඇට සාරය, දුම්කොළ සාරය, සබන් භූමිතෙල් මිශ්‍රණය, කොච්චි සාරය, අමු ගොම හා විවිධ පත්‍ර සාර, අරලිය මල් සාරය, කනේරු ඇට සාරය, පැපොල් සාරය, සුදුළූනු සාරය ......

3. පියුරේරියා, කැලපගෝනියම්, ඩෙස්මෝඩියම්, සෙන්ට්‍රොසීමා

4. ගොම පොහොර, කුකුල් පොහොර, කොළ පොහොර, කොම්පෝස්ට් පොහොර

5. සමෝච්ච රේඛා අනුව වගා කිරීම
පසට වසුන් යෙදීම
කාබනික ද්‍රව්‍ය පසට එකතු කිරිම.

6. මුං, කව්පි, මෑ, රටකජු, බෝංචි, සෝයා බෝංචි

7. කුරුළු තුඩ, පච්ච පෙරුමාල්, සුවදැල්, මඩතවාලු

8. බදුන්ගත වගාව, සිරස්මළු වගාව, තාප්පවල වගා බඳුන් රැඳවීම, නිර්පාංශු වගාව, ගුවනේ වගා ක්‍රම (කොකිඩාමා)

9. ග්ලයිපොසෙට්

10. * කෘෂි රසායනික මිශ්‍ර ජලය පානය කිරීම.
* ආරක්ෂිත ක්‍රම භාවිතා නොකර කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය
* නිර්දේශිත ප්‍රමාණයක් ඉක්මවා, කෘෂි රසායනික බෝග වගාවන්ට එකතු කිරිම.
* ජලය රඳා පවතින ස්ථානවල (වැව්, පොකුණු) ජලයේ වැවෙන කොහිල, නෙළුම් අල වැනි දෑ ආහාරයට ගැනීම.

(02) 1. පොල්, වී, මිරිස්, බඩ ඉරිඟු, බටු, තල, කුරක්කන්, අබ, කජු, පේර .... (ල.04)

2. ප්‍රභාසංස්ලේෂණය, අතු බෙදීමට හා බීජ ප්‍රරෝහණයට (ල.03)

3. i. පුෂ්පීකරණය(මල් පිපීමට)
ii. ප්‍රභා අවධි සංවේදී — කෙටි දින ශාක / දිගු දින ශාක
ප්‍රභා අවධි අසංවේදී - උදාසීන ශාක (ල.03)

(03) 1. * කායික ක්‍රියාකාරකම් සඳහා .
* පැල සිටුවීමට
* ශාකවල සන්ධාරක ගුණය පවත්වා ගැනීමට
* බිම් සැකසීමේ පහසුවට
* බීජ ප්‍රරෝහණයට
* බීජ ව්‍යාප්තියට
* පෝෂක අවශෝෂණයට
* අල බෝග අස්වනු නෙලීම පහසුවට (ල.10)

2. පිටාර ජල සම්පාදනය, ඇලි වැටි ජල සම්පාදනය, තීරු ජල සම්පාදනය, බේසම් ජල සම්පාදනය, වළලු ජල සම්පාදනය

3. * වගාකර ඇති බෝගය * බෝගයේ වර්ධන අවස්ථාව
* ජලය සැපයීමේ අරමුණ * පසේ වයනය
* සැපයිය හැකි ජල ප්‍රමාණය

(04) 1. ඉල්මැස්සා, පළතුරු මැස්සා, අවුලක පෝරා, එපිලැක්නා, පොල් කුරුමිණියා (ල.03)
2. නම් කළ කෘමියාගේ හානියා හා පාලන ක්‍රමය (ල.04)
3. අර්ධ රූපාන්තරණයේ අවස්ථා පිළිවෙලින් ලියන්න. (ල.03)

(05) 1. * පසේ භෞතික තත්වය වැඩිදියුණු කිරීම.
* පාංශු ව්‍යූහය දියුණු කිරීම, පාංශු වාතනය දියුණු කිරීම, පාංශු වයනය දියුණු කිරීම,
* ජල වහනය දියුණු කිරීම
* මූල පද්ධතිය පැතිරීමට පහසු වන පරිදි පස බුරුල් කිරීම
* පසේ ගල්මුල් ඉවත් කිරීම
* පසට පොහොර මිශ්‍ර කිරීම.
* පළිබෝධ පාලනයට
* වල් පැළෑටි පාලනය (ල.04)

2. A. වගා බිමේ බෝග පැළ හෝ බීජ සිටුවීමෙන් පසු පස සමඟ කරන සියලු ක්‍රියාකාරකම් (ල.01)
B. උදැල්ල, හෝව, ටූල් කැරියර්, අත් මුල්ලු, තුන් පුරුක් කල්ටිවේටරය, අත් ඉස්කෝප්ප, රොටරි වීඩරය (ල.02)

3. අතින් ක්‍රියාකරන - උදැල්ල, මුල්ලු, හෝව, අත්පෝරුව, අත් ඉස්කෝප්පුව
සත්ව බලයෙන් ක්‍රියාකරන - ගැමි ලී නගුල, ඇණදත් පෝරුව, සැහැල්ල යකඩ නගුල
යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන - තැටි නගුල, හැඩ ලැලි නගුල, ජපන් පරිවර්ත්‍ය නගුල, රොටවේටරය, දැති පෝරුව, තැටි පෝරුව, රිජරය

(06) 1. ගිල්වූ පාත්ති (ල.02)
2. මීටර් 01 (ල.02)
3. කාබනික පොහොර + මතුපිට පස් 1:1 මිශ්‍රණය (ල.03)
4. මැටි බඳුන්, කෙසෙල් පට්ටා බඳුන්, කඩදාසි බඳුන්, පොල් ලෙලි, කොහුබත් වලින් නිපදවූ බඳුන්, ශාක පත්‍ර බඳුන් (කෙසෙල්, අරලිය) ..... (ල.04)

(07) 1. * ශාක මිටිය * ඇඳ වැටීමට ඔරොත්තු දේ
* පත්‍ර කෙටිය, පළල්ය, සිරස්ව පිහිටයි. * පදුරු දැමීම වැඩියි.
* බොහෝ ප්‍රභේදවල බීජ අක්‍රියතා කාලයක් නැත. * අස්වනු වැඩියි.
* රසායනික පොහොර වලට ඉහළ ප්‍රතිචාරයක් දක්වයි. * ප්‍රභාඅවධි අසංවේදී වේ
* ධාන්‍ය පිදුරු අනුපාතය වැඩිය (ල.04)

2. වර්ධක අවධිය - ප්‍රරෝහණයේ සිට පුෂ්ප මූලකෘති ඇතිවීම දක්වා කාලය
ප්‍රජනක අවධිය - පුෂ්ප මූලකෘති ඇතිවීම සිට පිදීම දක්වා
මේරීමේ අවධිය - පීදීමේ සිට අස්වනු නෙලීමට තරම් මේරීම දක්වා (1/2 බැගින් ල. 03)

3. බෝඹුවල - B.W.
බතලගොඩ - B.G.
අම්බලන්තොට - A.T